දරුවන් උදෙසා
බයිබලයක්

# පාවුල් තුමාගේ විශ්මිත සංචාර



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජේසුස් වහන්සේ ගේ සේවකයන් වූ
පාවුල් සහ සීලස් සිරගෙදර
සිටියෝය. ඔවුන් කිසි වරදක්
කර නොතිබුණි. ඔවුන් විසින්
ස්ත්‍රියකගෙ◌් ශරීරය තුළ
වුන් යක්ෂයෙකු පළවා හැර
තිබුණි. පිලිප්පියේ විසූ පිළිම
වලට නමස්කාර කරන
මිනිසුන්ට සැබෑ දෙවියන් වහන්සේගේ
සහ උන්වහන්සේගේ පුත් ජේසුස්
වහන්සේගේ
බලය ඔවුහු
පෙන්වූවෝය.
ඒ නිසා ඔවුන්
අත්අඩංගුවට
ගෙන, කස පහර දී,
සිර කර තිබුණි.



පාවුල් සහ සීලස්
කෝපයට පත් වන්නට
ඇතැයි ඔබ අපේක්ෂා
කළා විය හැකිය. නමුත්
ඔවුන් එසේ නොවීය.
මධ්යම රාත්රියේදී ඔවුහු
දෙවියන් වහන්සේට
ප්රශංසා ගීතිකා
ගායනා කරමින්
සිටියෝය! අනෙකුත්
සියලුම සිරකරුවන්ට
සහ සිරගෙදර
භාරකරුට එය ඇසිණි.



එක්වරම ගායනය නතර විය. දෙවියන් වහන්සේ සිරගෙදර සොලවමින් භූමිකම්පාවක් එවූ සේක. සියලු දොරවල් විවෘත විය. සියල්ලන්ගේම දම්වැල් ගැලවුණේය.





ඇතිවුන කැළඹීමත්
සමඟ සිරකරුවන්
සියල්ලෝම පලා
ගොස් ඇති බව
සිරගෙදර භාරකරු
විශ්වාස කළේය.
එක්කෙනෙකු හෝ
පැන ගියොත් ඔහුට
මරණ දඬුවම දෙනු
ඇත. කණගාටුදායක
ලෙස, අසරණවූ
සිරගෙදර භාරකරු
ඔහුගේ කඩුව ඇද
ගත්තේය. ඔහු
සියදිවි නසාගන්නට
සූදානම් වූයේය.

එහෙත්, පාවුල් කතා කරමින්,
“ඔබට හානියක් කර නොගන්න,
අප සියල්ලෝම මෙහි සිටිමු.”
සිරගෙදර භාරකරු එය දැක,
“ස්වාමිවරුනි, ගැළැවෙනු
පිණිස මා කුමක් කළ යුතු
දැ”යි ඇසීය. එබැවින් ඔව්හු,
“ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි
අදහාගන්න, එවිට ඔබත්
ඔබගේ ගෙදර අයත්
ගැළවෙනු ඇතැ”යි කීවෝය.
සිරගෙදර භාරකරු
අදහා ගත්තේය.





පසු දින නිදහස් වූ පාවුල් සහ සීලස් තවත් බොහෝ නගරවලට ගොස් ජේසුස් වහන්සේ ගැන මිනිසුන්ට කීවෝය. සමහර අය විශ්වාස කළෝය, තවත් අය ඔවුන්ට රිදවීමට උත්සාහ කළෝය. නමුත් දෙවියන් වහන්සේ තම සේවකයන් සමඟ සිටිය සේක. එක රාත්‍රියක පාවුල් පැය ගණනක් දේශනා කළේය. විවෘත ජනේලයක් අසල වාඩි වී සිටි තරුණයෙකුට නින්ද ගියේය. සිදුවූයේ කුමක්දැයි ඔබට අනුමාන කළ හැකිය.



තරුණයා මියගොස් ඇති බව කවුරුත් දැන සිටියෝය. එහෙත්, පාවුල් බැස ගොස්, ඔහුව වැලඳගෙන “ඔහුගේ ජීවිතය ඔහු තුළ ඇතැ”යි කීවේය. ඔවුන් තරුණයා පණපිටින් ගෙන ආ අතර ඔවුහු ඉතා සතුටට පත් වූවෝය.

පාවුල් සහ සීලස් යුරෝපයේ සංචාරය කරන විට බොහෝ වික්‍රමාන්විතයන් සිදු විය. පාවුල් ගේ ශ්‍රේෂ්ඨතම වික්‍රමය සිදු වූයේ ඔහු නැවක සිටියදීය. මේවා වානේ වලින් නිමවූ නැව් නොව, රුවල් බෝට්ටු විය. කුණාටු සහිත කාලගුණය තුළ පහසුවෙන් පැද්දෙන සුළු විය.





පාවුල්ව නැවත අත්අඩංගුවට ගත් බැවින් ඔහු නැවක් තුළ සිටියේය. ඔහුට ලෝකයේ අගනුවර වන රෝමයේ, අධිරාජ්‍යයා ඉදිරියේ පෙනී සිටීමට සිදුවී තිබුණි. අධික සුළං නෞකාවේ වේගය අඩු කළේය. කුණාටු සහිත කාලගුණයක් ඇති වන්නට යන බව පෙනෙන්නට තිබුණි. එය පාවුල්ට සහ අනෙකුත් සිරකරුවන්ට මෙන්ම නැවේ කාර්ය මණ්ඩලයට ද දුෂ්කර ගමනක් විය.

“මිනිසුනි, මේ ගමන විපතකින් කෙළවර වන බව මට වැටහෙනවායැ” යි පාවුල් අවවාද කළේය. කපිතාන්වරයා සවන් දුන්නේ නැත. ඔවුහු නැව පදවාගෙන මුහුදට ගියෝය. විශාල කුණාටුවක් පහර දුන් විට, නැව කැඩී නොයනු ඇතැයි අපේක්ෂාවෙන් ඔවුහු නැව වටා ලණු බැඳ තැබූහ. නැව කැඩී ගියහොත් එය සියල්ලන්ටම ජලය පිරී සොහොනක් වනු ඇත.



නැව කෙතරම් තද කුණාටුවකට හසු වී ඇත්ද යත්, එය සැහැල්ලු කිරීමට උදව් කරන ලෙස කපිතාන්වරයා සියලු දෙනාටම අණ කළේය. තුන්වෙනි දවසේදී, ඔවුන් නැවේ භාණ්ඩ මුහුදට විසි කළෝය.

සමහරවිට එය නැව කැඩී නොයන්නට උපකාරයක් වනු ඇත.



රාත්රියේදී, දේවදූතයෙක් පාවුල් අසල සිට, සියල්ල යහපත් ලෙස සිදුවන බව පවසමින් සිටියේය. පාවුල් ඔවුන් අමතා “මිනිසුනි, ධෛර්යවත් වන්න, මන්ද මම විශ්වාස කරන දෙවියන් වහන්සේ මට කී ලෙසම සිදුවෙනු ඇත. කෙසේ වෙතත්, අපි එක් දූපතකට ගොඩ බසින්නට ඕනෑය” යනුවෙන් කීවේය. පාවුල් එසේ පැවසූ විට අනෙක් අය දිරිමත් වූවෝය.



දින කිහිපයකට පසු බෝට්ටුව මෝල්ටා දූපත ආසන්නයේදී කැඩී ගියේය. එය නොගැඹුරු පාෂාණ මත වැදී කැඩුණි. කපිතාන්වරයා, පිහිනීමට හැකි අයට පළමුවෙන් පිහිනා ගොඩබිමට යන ලෙස අණ කළේය. සමහරුන් ලෑලි මතද, තවත් සමහරු නැවේ කැඩුණු කැබලි මතද හිඳිමින් සියල්ලෝ ගොඩබිමට පිහිනා ගියෝය.



මෝල්ටාවේදී දෙවියන් වහන්සේ උන්වහන්සේගේ බලය පෙන්වූ සේක. ඔවුන් ගිනි මැළයක් අවුලවනු සඳහා දර එකතු කරන අතරතුර, සර්පයෙක් පාවුල්ට දෂ්ට කළේය. මිනිස්සු ඔහු මැරේවියැයි සිතුවෝය. නමුත් සර්පයා දෂ්ට කිරීමෙන් පාවුල්ට හානියක් නොවීය. එවිට මිනිස්සු, පාවුල් දෙවියෙක් යැයි සිතුවෝය. බොහෝ රෝගීන් පැමිණි අතර, පාවුල් ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ පසු දෙවියන් වහන්සේ ඔවුන්ව සුව කළ සේක.



අවසානයේ පාවුල් රෝමයට පැමිණියේය. ඔහුගේ නඩුව උසාවියේ විභාග කිරීමට වසර දෙකකට වැඩි කාලයක් ගත විය. ඒ කාලය තුළ පාවුල් නිවසක් කුලියට ගෙන අමුත්තන් පිළි ගත්තේය. තම අමුත්තන්ට පාවුල් පැවසුවේ කුමක් ගැනදැයි ඔබ දන්නවාද? ඒ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැනය! ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැනය! පාවුල් රෝමයේදීත් ඔහුගේ අනෙකුත් සියලුම සංචාර වලදී මෙන් දෙවියන් වහන්සේගේ සේවකයා වූයේය.



“මම යහපත් සටනක් කළෙමි, මාගේ දිවීම අවසන් කළෙමි, මම ඇදහිල්ල රකිමි” යි පාවුල් රෝමයේ සිට ලිවීය. ඔහුගේ ජීවිතය අවසන් වූයේ කෙසේදැයි බයිබලය අපට නොකියයි. නමුත් වෙනත් වාර්තා පවසන්නේ රෝමයේදී නීරෝ අධිරාජ්යයාගේ නියෝගයෙන් පාවුල්ගේ හිස ගසා දැමූ බවයි. පාවුල් මිය ගියේ ඔජේසුස් ක්රිස්තුස් වහන්සේ ගැන අන් අයට පවසමින් දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත සේවකයෙකු ලෙස ජීවත් වීමෙන් පසුය.



පාවුල් තුමාගේ විශ්මිත සංචාර

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ක්රියා 16, 27, 28

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)